**ශීර්ෂය - 403 කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 15 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 15 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි .
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**මූල්‍ය නොවන වත්කම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් යටතේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.640,032,832 ක් වුවද එය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (එස් ඒ 82) අනුව රු.722,446,259 ක් වූයෙන් රු. 82,413,427 ක නොසැසඳීමක් විය. | ඔබගේ නිරීක්ෂණ අනුව, මූල්‍ය ප්‍රකාශ කට්ටලයේACA-6 ප්‍රකාශය වෙනුවට අමුණා ඇති SA-82 ආකෘතියේ දක්වා ඇති වටිනාකම හා සැසඳීමේදී රු. 82,413,427 ක වෙනසක් ඇති බව පිළිගනිමි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 43 කට අදාලව එකතුව රු.5,768,047,016 ක් ඉතිරි වී තිබූ අතර එය සියයට 24 සිට සියයට 100 දක්වා පරාසයක විය. | 2021වර්ෂයේදී මෙම අමාත්‍යාංශයේ වැය විෂයන්හි යම් ඉතිරිවීම් සිදු වී ඇති බව පිළිගන්නා බව. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කර වියදම් කළමනාකරණය කළ යුතු වීම. |
| (ආ) මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයයන් 3 ක් සඳහා මාරු කරන ලද ප්‍රතිපාදන වලින් සියයට 64 සිට සියයට 100 අතර පරාසයක ඉතිරිවීම් විය. | යම් ඉතිරිවීමක් ඇති වෙතැයි අපේක්ෂා කරන ලද වැය විෂයයන් මඟින් මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කර ඇති බව. | -එම- |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොඩනැගිලි අළුත්වැඩියා හා ඉදිකිරීම් වලට අදාල බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල බැරකම් පිලිබඳ ප්‍රකාශනය හා ඉංජිනේරු වාර්තා සමඟ සැසඳීමේදී රු. 562,365,647 ක වෙනසක් පැවතුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංජිනේරුවරයාගේ බැරකම් පිළිබඳ විමසීම් කලද 2022/02/28 දිනට පෙර ගිණුම සකස් කර අවසන් කල හැකි වන පරිදි අදාල බැරකම් නොලැබුණු බව. | බැදීම් හා බැරකම් නිවැරදිව හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කටයුතු මේ වන විට අවසන්ව ඇති බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන චක්රලේඛය හා 2018 පෙබරවාරි 06 දිනැති අංක 05/2018 දරන (සංශෝධිත) චක්‍රලේඛය | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව ආයතනය විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කර නොතිබුණි. | පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය මේ වන විට සකස් කර අවසන් කර ඇති අතර මුද්‍රණය කිරීමේ කටයුතු පමණක් සිදුකිරීමට නියමිතව ඇති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ක්‍රියාකාරී සැලස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වන පරිදි ක්රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂය ආරම්භයේ දී සංවිධාන ව්‍යුහය සකස් කර අවසන් කර නොතිබූ බැවින් එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට නොහැකි වූ බව. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ සතු වාහන 2 ක් 2012 වර්ෂයේ සිට හා වාහන 6 ක් 2015 වර්ෂයේ සිට භාවිතා කරමින් පැවතියද එම වාහන පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අපොහොසත් වී තිබුණි. | පවරා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු වීම. |

### 3.3 විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාන්තා උපකාරක දුරකථන සේවා ව්‍යාපෘතියේ (Toll Free Help Lines Project ) අරමුණු ඉටු කර ගැනීමට රු.මිලියන 79 ක් ප්‍රතිපාදනය කර තිබුණද රු.මිලියන 7.19ක් පමණක් වැය කර තිබුණු අතර එය මුළු ප්‍රතිපාදන මුදලෙන් සියයට 8ක් පමණක් විය. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිපාදනය කර ඇති අරමුදල් අදාල අරමුණු ඉටු කර ගැනීම සඳහා උපයෝජනය කළයුතු වීම. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සුරක්ෂා සිසු රක්ෂණාවරණ වැඩසටහන | | |
| (i) රක්ෂණාවරණ සඳහා ආයතන තෝරා ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව 2018 ඔක්තෝබර් 1 සිට 2022 දෙසැම්බර් 1 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් වෙත එක් වර්ෂයකදී හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත වර්ෂ 4 කදී කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතු වීම. |
| (ii) සුරක්ෂා සිසු රක්ෂණාවරණ ක්‍රමය ක්‍රියාත්මක වූ දින සිට 2021 දෙසැම්බර් දක්වා ඉදිරිපත් කරන ලද අයදුම්පත් 33,974 ක් ප්‍රතික්ෂේප වී තිබුණ ද එසේ ප්‍රතිලාභ නොලැබීමට හේතු පිළිබඳ පසුවිපරම් කිරීමක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. සියළු තොරතුරු නිරීක්ෂණය කිරීම සඳහා රක්ෂණ සංස්ථාව සමඟ ඒකාබද්ධව පරිගණක දත්ත පද්ධතියක්ද පවත්වාගෙන නොතිබුණි. | අදාල ආයතන වලින් ප්‍රතික්ෂේපවීම සම්බන්ධ තොරතුරු විටින් විට ලබා දී ඇත. | ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභ ලබා දීමට පියවර ගත යුතු වීම හා රක්ෂණ ආයතනයට ඉදිරිපත් කරනු ලබන රක්ෂණ අයදුම්පත් පිළිබඳ තොරතුරු ඇතුළත් පාසලේ හෝ අමාත්‍යාංශයේ පරිගණක දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතු වීම. |
| (ආ) පාසැල් නිල ඇඳුම් රෙදි සැපයීම | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 ඡේදයට අනුකූලව සැපයුම්කරුවන්ගේ ධාරිතාවය පිළිබඳ පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව 2021 වර්ෂය සඳහා නිල ඇඳුම් රෙදි සැපයීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතුවෙන් 2021 වර්ෂයට අවශ්‍ය සියළු නිල ඇඳුම් රෙදි පාසැල් වෙත ලබා දීම සඳහා 2021 ජනවාරි 31 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | පාසැල් හා කලාප මට්ටමින් සිටි ශිෂ්‍ය සංඛ්‍යාව පිලිබඳව යාවත්කාලීන කරන ලද නිවැරදි දත්ත පද්ධතියක් නොමැති වීම හා 2021 වර්ෂයේ 1 වසර සඳහා ඇතුලත් වීමට අපේක්ෂිත දරුවන් ගණන පුරෝකථනය කර ගැනීමට නොහැකි වීම යනාදී කරුණු හේතුවෙන් නැවත නිල ඇඳුම් සඳහා රෙදි මීටර් 1,279,342 ක් මිලදී ගැනීමට 2021 මාර්තු 23 දින පැවති ස්ථාවර ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී තීරණය කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.299,004,940 ක් වැයකර තිබුණි. එහිදී පළමු ඇණවුමෙන් ඉතිරි වී තිබූ රු. 16,090,230 ක් වටිනා කාණ්ඩ 15ට අදාල රෙදි පැකට් 54570 ක ප්‍රමාණය කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | 2021 වර්ෂයේ නිල ඇඳුම් මිලදී ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කර ඇති අතර මුල් ඇණවුම මඟින් ලබා දී නොතිබූ පළමු වසර හා ඌන නිල ඇඳුම් රෙදි ලබා දීම රාජ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කර ඇති බව හා පළමු ඇණවුමෙන් ලබා දී ඇති පාසැල් නිල ඇඳුම් වර්ග15 කට අයත් නිල ඇඳුම් වර්ගවල ඉතිරි රෙදි ප්‍රමාණයන් අතිරේක ඇණවුමත් සමඟ අදාල සැපයුම්කරුවන් බෙදා හැරීමට කටයුතු කර ඇති බව. | වාර්ෂිකව ශිෂ්‍ය සංඛ්‍යාව යාවත්කාලීන වන පරිදි නිවැරදි දත්ත පද්ධතියක් නඩත්තු කල යුතු වීම හා ඇස්තමේන්තු නිවැරදිව පිලියෙල කල යුතු වීම. |
| (iii) | 2021 වර්ෂයට අවශ්‍ය සියළු නිල ඇඳුම් 2020 නොවැම්බර් 15 දිනට පෙර පාසැල් වෙත ලබා දීම අවශ්‍යතාවය වුවද අවසන් නිල ඇඳුම් තොගය කලාප කාර්යාල වලට භාර දී තිබුණේ 2021 ජුලි 19 දින වන අතර ප්‍රසම්පාදන සැලැස්ම අනුව 2021 වර්ෂය සඳහා නිල ඇඳුම් රෙදි කලාප කාර්යාලවලට භාර දීමේ සමස්ත ප්‍රමාදය මාස 7ක් ඉක්මවා තිබුණි. | අතිරේක ඇණවුමක් මඟින් පාසැල් නිල ඇඳුම් ලබා දීමට සිදුවීම නිසා ප්‍රමාද වීම සිදු වී ඇති බව. | ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා ඇති කාලවකවානු අනුව කටයුතු කල යුතු වීම. |
| (ඇ) | අමාත්‍යාංශය විසින් රු.3,500,000ක් වැය කර කාන්තා ව්‍යවසායකයින් සඳහා ඩිජිටල් අලවිකරණ වේදිකාවක් (Digital Marketing Platform) 2020 වර්ෂයේ නිර්මාණය කර තිබුණි. කාන්තා ව්‍යවසායකයින් සඳහා කාණ්ඩ 13 ක් යටතේ ලියාපදිංචි කිරීම සඳහා මෙය නිර්මාණය කර තිබූ අතර 2022 මැයි මාසය වන විටත් කාණ්ඩ 4 ක් යටතේ ව්‍යවසායකයින් 8 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ආර්ථික වශයෙන් ඵලදායී කටයුතුවල අරමුදල් යෙදවිය යුතුවීම. |

## 3.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිවිසුම් ගත වටිනාකම රු. 423,077,168 ක්වූ පාසැල් ගොඩනැගිලි ඉදිකිරීම් 18 ක 2021 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් නිමකළ යුතු කාලය අවසන් වී වර්ෂ 1 සිට වර්ෂ 4 ක් දක්වා කාලයක් ගත වී තිබුණද එම ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබූ අතර ඊට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදහස් දක්වා නොමැත. | ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ගත කාලය තුල අවසන් කිරීමට පියවර ගත යුතු වීම. |
| (ආ) | සෑම දිස්ත්‍රික්කයකම ත්‍රිභාෂා පාසැල් ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ පාසැල් 14 ක ව්‍යාපෘති වැඩ 33ක් නිම කිරීමට හා පොකුරු පාසැල් පද්ධතිය ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ පාසැල් 69ක ව්‍යාපෘති වැඩ 72ක් නිම කිරීමට 2021 වර්ෂයේ සැලසුම් කර තිබුණද එවායේ ප්‍රගතිය පිලිවෙලින් සියයට 2ක සිට සියයට 10ක මට්ටමක පැවතුණි. | 2020,2021 වර්ෂ වල පැවති වසංගත තත්ත්වයද බිල්පත් පියවීමට අක්මුදල් භාණ්ඩාගාරයෙන් නොලබීමද හේතු වූ බව. | - එම - |

## 3.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවදානමට ලක් වු කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම අරමුණු කරගෙන අම්පාර දිස්ත්‍රික්කයේ දිරිය වනිතා ඇගළුම් හා පාවහන් ව්‍යාපෘතිය සහ දිරිය වනිතා අත්‍යන්ත්‍ර නිමවුම් විශේෂ ව්‍යාපෘතියක් 2020 වර්ෂයේ ආරම්භ කර 2021 වර්ෂය අවසන් වන විට යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිලදී ගැනීම සහ ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සඳහා අමාත්‍යාංශය විසින් රු.6,863,065ක් වැයකර තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතියේ මුළු ප්‍රතිලාභීන් ගණන 20ක් වැනි අවම මට්ටමක පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | ආර්ථික වශයෙන් ඵලදායි කටයුතුවල අරමුදල් යෙදවිය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂය වෙනුවෙන් වර්ග 402 කට අයත් පෙළ පොත් පිටපත් 32,540,750 ක් 2021 නොවැම්බර් 15 දින වන විට බෙදාහැර අවසන් කිරීමට සැලසුම් කර තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් පොත් 12,365,485 ක් හෙවත් සියයට 14ක් ගබඩාවලට නොලැබී තිබුණි. | අදහස් දක්වා නොතිබූ බව. | සැලසුම් කරන ලද කාර්යයන් නියමිත කාලය තුළ කාර්යක්ෂමව ඉටු කර ගත යුතු වීම. |